සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීමට (එච්එස්එස්) එන්නත් හා ප්‍රතිශක්තිකරණය සඳහා වූ ගෝලීය සන්ධානය (ගැවි) වැඩ සටහන- 2013

--------------------------------------------------------------------------------------------------------------

සෞඛ්‍ය පද්ධති ශක්තිමත් කිරීමට (එච්එස්එස්) එන්නත් හා ප්‍රතිශක්තිකරණය සඳහා වූගෝලීය සන්ධානය (ගැවි) වැඩ සටහනේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ එන්නත් හා ප්‍රතිශක්තිකරණය සඳහා වූ ගෝලීය සන්ධානය (ගැවි) අතර 2013 ජුනි 19 දින එළඹි ප්‍රදාන ගිවිසුමේ 36 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

--------------------------------------------------------------------------------

සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීමට (එච්එස්එස්) එන්නත් හා ප්‍රතිශක්තිකරණය සඳහා ගෝලීය සන්ධානයේ ඉල්ලුම්පත්‍ර ආකෘති - 2007 ට අනුව, සෞඛ්‍ය අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මාතෘ හා ළමා සෞඛ්‍ය (එම්සීඑච්) සේවා ආවරණය සහ තත්ත්වය දියුණු කිරීම මඟින් අඩුසේවා සැපයුම් ප්‍රදේශවල මාතෘ හා ළමා සෞඛ්‍ය සම්බන්ධයෙන් (එම්සීඑච්) ගිලන්වන හා මරණයට පත් වන සංඛ්‍යාව වේගයෙන් අඩුකිරීම වැඩසටහනේ අරමුණ වේ.

සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීමට (එච්එස්එස්) එන්නත් හා ප්‍රතිශක්තිකරණය සඳහා වූ ගෝලීය සන්ධානය වැඩසටහනේ නිශ්චිත අරමුණු වන්නේ,

(I) 2014 වර්ෂය වන විට ජාතික සම්මතයට ළඟාවීම සඳහා අඩුසේවා සැපයුම් දිස්ත්‍රික් 10 ක යෝග්‍ය කුසලතා සංයෝගයකින් ප්‍රාථමික සෞඛ්‍ය ආරක්ෂණ කාර්ය මණ්ඩලය වැඩි කිරීම.

(II) 2014 වර්ෂය වන විට මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා බෙදා හැරීම සඳහා අඩු සේවා සැපයුම් දිස්ත්‍රික් 10 ක ජාතික ප්‍රමිතීන් ඉටුකර ගැනීම සඳහා මූලික යටිතල හා විස්තරාත්මක සැලසුම් ලබාගත හැකි බවට තහවුරු කර ගැනීම.

(III) 2014 වර්ෂය වන විට මධ්‍යම මට්ටමේ පහසුකම් කළමනාකරුවන් මඟින් අඩුසේවා සැපයුම් දිස්ත්‍රික් 10 ක ප්‍රමාණවත් මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා සිදු කරන ලද බවට තහවුරු කර ගැනිම.

එන්නත් හා ප්‍රතිශක්තිකරණය සඳහා ගෝලීය සන්ධාන (එච්එස්එස්) වැඩසටහනේ ඉල්ලුම්පත්‍ර - ආකෘති 2007 අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො 4,505,000 ක් වන අතර, ගෝලීය සන්ධානය විසින් මුළු මුදලම මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. වැඩසටහන එහි කටයුතු 2008 ජනවාරි 01 දින ආරම්භ කරන ලද අතර 2014 දෙසැම්බර් 31 වන විට නිමකිරීමට නියමිතය.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

---------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම්, හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, වැඩසටහන් කළමනාකරණයෙහිලා සතුටුදායක පාලනයක් සහ වැඩසටහනේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ප්‍රදානය කරනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද වැඩසටහන් වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, වැඩසටහනේ මෙහෙයුම්වලින් උද්ගතවූ වත්කම් සහ වගකීම්, ප්‍රදාන යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වාගනු ලැබූවේද යන බව.

(ඇ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, වැඩසටහනේ අරමුණ සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඈ) වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයන්ට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඉ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඊ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව.

(උ) එන්නත් හා ප්‍රතිශක්තිකරණය සඳහා වූ ගෝලීය සන්ධාන ඉල්ලුම්පත්‍ර ආකෘති - 2007 හි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලවී තිබුණේද යන බව.

3. මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 හා 6 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මාගේ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව 2013 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව.

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) එන්නත් හා ප්‍රතිශක්තිකරණය සඳහා වූ ගෝලීය සන්ධාන ඉල්ලුම්පත්‍ර ආකෘති - 2007 හි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලවී තිබුණු බවත්ය.

4. මූල්‍ය ප්‍රකාශන
----------------

4.1 මූල්‍ය කාර්යසාධනය
---------------------

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වැඩසටහනේ වියදම රු. 108,794,143 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.381,250,000 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වර්ගය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| ස්ථාවර වත්කම් | 27,693,628 | 23,161,622 | 108,761,632 |
| සිවිල් වැඩ ( අළුත්වැඩියා සහ නවීකරණය කිරිම. ) | 54,922,040 | 27,888,434 | 165,305,860 |
| පුහුණු | 18,027,961 | 35,356,649 | 86,917,775 |
| වෙනත් මෙහෙයුම් පිරිවැය | 8,150,514 | 5,193,791 | 20,264,733 |
| එකතුව | 108,794,143 | 91,600,496 | 381,250,000 |

5. විගණන නිරීක්ෂණ

--------------------

2012 හා 2013 වර්ෂ සඳහා වැඩ සටහන විසින් මිලදී ගන්නා ලද ස්ථාවර වත්කම් පිළිබඳ සමීක්ෂණ සිදු කර නොතිබුණි.

6. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

----------------------------------------

6.1 අරමුදල් උපයෝජනය

------------------------

අරමුදල් මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදන, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කීහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍යායනය කිරීම සඳහා එකඟ වූ මුදල | | වාර්ෂික අයවැය ලේඛනයේ වෙන්කිරීම් | සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කළ මුදල | | 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ මුදල | |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො | රු. | රු. | එජඩො | රු. | එජඩො | රු. |
| එන්නත් සහ ප්‍රතිශක්තිකරණ ගෝලිය සන්ධානය | 4,505,000 | 516,677,613 | 108,800,000 | 899,310 | 108,794,143 | 3,385,533 | 381,250,000 |
| ශ්‍රී ලංකා රජය | - | - | 3,687,470 | 27,188 | 3,534,547 | 27,188 | 3,534,547 |
| එකතුව | 4,505,000 | 516,677,613 | 112,487,470 | 926,710 | 112,328,690 | 3,412,721 | 384,784,547 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේ වැඩ සටහන ආරම්භ වූ දින සිට 2013 දෙසැම්බර් 31 දක්වා ගෝලීය සන්ධානයෙන් මහා භාණ්ඩාගාරයට රු.516,677,613 කට සමාන එජඩො 4,505,000 ක් ලැබී තිබුණද, 2013 දෙසැම්බර් 31 දක්වා වැඩ සටහනේ සමුච්චිත වියදම, ලැබුණු මුළු ප්‍රදානයෙන් සියයට 75 ක් නියෝජනය වන රු. 381,250,000 කට සමාන එජඩො 3,385,533 ක් විය. 2013 වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තු යටතේ වැඩසටහන සඳහා සලසන ලද රු.165,000,000 ක්වූ මුළු වෙන් කිරීම රු. 112,487,470 දක්වා අඩු කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා එයින් රු.112,328,690 ක මුදලක් වැය කර තිබුණි.

(ආ) ප්‍රගති වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය තුළදී රු. 46,050,311 ක පිරිවැයකට කාර්යයන් 31 ක් ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර තිබුණි. කෙසේ වුවද එම කාර්යයන් කිසිවක් ක්‍රියාත්මක කර

නොතිබුණි. තවද අත්තිකාරම් ලෙස රු. 2,940,696 ක මුදලක් ගෙවන ලද කාර්යයන් 18 ක්ද එහි ඇතුළත් වී තිබුණි.

(ඈ) මීට අමතරව, සමාලෝචිත වර්ෂය තුළ වෙනත් කාර්යයන් 09 ක් යටතේ වැය කිරීම සඳහා ඇස්තමේන්තුගත කළ රු.6,248,611 ක මුදලින්, එම කාර්යයන් සම්පූර්ණ කිරීම සඳහා රු.1,938,241 ක්පමණක් වැය කර තිබු හෙයින්, එම කාර්යයන් සඳහා ඇස්තමේන්තු කිරීම විධිමත්ව කර නොතිබු බව නිරීක්ෂණය විය. අදාළ කාර්යයන් සඳහා අරමුදල් උපයෝජනය සියයට 14 සිට සියයට 49 දක්වා පරාසයක විය.

(ඇ) වැඩසටහන් ගිවිසුමේ විධිවිධාන අනුව, සෞඛ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීමට එන්නත් කිරීම හා ප්‍රතිශක්තිකරණය සඳහා වූ ගෝලීය සන්ධාන වැඩසටහනේ භාරකාරත්වය සම්බන්ධයෙන් හා මෙහෙයුම් පරිපාටි සහ පිළිපැදිය යුතු රෙගුලාසි තහවුරු කර ගැනීම වෙනුවෙන් වගකිව යුතු වේ. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා වැඩසටහනේ කාර්යයන් වෙනුවෙන් අභ්‍යන්තර විගණන වැඩසටහනක් පිළියෙල කර හෝ අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. තවද 2010 වර්ෂය සහ 2011 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයන් සිදු කර ඒ පිළිබඳ නිරීක්ෂණයන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් කරන ලද නිර්දේශයන්ද සහිතව ඉදිරිපත් කර තිබුණද, ඒවා ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) මධ්‍යම පළාත් සභාව විසින් නිකුත් කරන ලද මුදල් රීති අංක 261.2.2 අනුව, ඕනෑම කාර්යයකට ලබා ගන්නා අත්තිකාරම් සතියක් ඇතුළත පියවිය යුතුය. කෙසේ වුවද නුවරඑළිය - දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී කාර්යාලය විසින් පවත්වන ලද වැඩසටහන් 08 ක කාර්යයන් සඳහා ලබා ගන්නා ලද එකතුව රු.170,050 ක් වූ අත්තිකාරම් දින 56 සිට දින 134 දක්වා කාල ප්‍රමාදයන්ගෙන් පසුව නිරවුල් කර තිබුණි.

## 6.2 භෞතික ප්‍රගතිය

---------------

නිශ්චිත වැඩසටහන් කාල පරිච්ඡේදය ඇතුළත අරමුණු ඉටුකර ගැනීම තහවුරු කර ගැනීම පිණිස කාර්තුමය, අර්ධ වාර්ෂික ආදී වශයෙන් මූල්‍ය හා භෞතිකව අවධාරණය කරමින් සමස්ත වැඩසටහන් කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් තිබිය යුතු වුවත්, එවැනි සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

## 6.3 වත්කම් කළමනාකරණය

-----------------------

කලාප කාර්යාල විසින් වැඩසටහනේ සම්පත්, අරමුණු ගත කාර්යයන් සඳහා ඵලදායීව යොදාගෙන නොතිබු බව විගණනයේදී නිරීක්ෂණය විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා පහත විස්තර කෙරේ.

(අ) රු. 245,158 ක පිරිවැයකට ස්ථාවර වත්කම් විෂයයන් 07 ක් මිලදී ගැනීම සඳහා 2013 දෙසැම්බර් 26 දින වැඩසටහන විසින් ගෙවීම් කර තිබුණද, එම වත්කම් 2014 සැප්තැම්බර් 16 වන විටත් ලැබී නොතිබුණි.

(ආ) කඩුගන්නාවේ පළාත් සෞඛ්‍ය පුහුණු ආයතනය සංවර්ධනය කිරීම සඳහා කාර්යයන් වෙනුවෙන් රු.1,553,776 ක මුදලක් වැඩ සටහන විසින් වැයකර තිබුණු අතර එම කාර්යයන් වැඩසටහන විසින් සිදුකළ යුතු අරමුණු කළ කාර්යයන්ට අදාළව නොවීය. තවද ප්‍රධාන ශ්‍රවණාගාරය සඳහා වායු සමීකරණ මිළදී ගැනීම වෙනුවෙන් ප්‍රතිපාදනය කරන ලද රු.1,408,000 ක මුදලක් 2014 මාර්තු 31 වන විටත් තැන්පතු ගිණුමක පැවතුණි. කෙසේ වුවද මධ්‍යම පළාතේ, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් එම වෙන් කිරීම දැනටමත් වැයකර ඇති බව සෞඛ්‍ය අමාත්‍යාංශයට දන්වා තිබුණි.

**6.** **පද්ධති හා පාලන**

**-----------------**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) වත්කම්

(ආ) අභ්‍යන්තර විගණනය

(ඇ) පළාත් කාර්යාලවල කාර්යසාධනය